IHRA
UNIVERSITY OF COLOMBO

22

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2014/15

(ප්‍රථම සෙමෙස්තර පරීක්ෂණය)

(පවත්වන ලද්දේ 2016 ඔක්තෝම්බර්)

## BLE 302 - ජනගහන අධ්‍යයනය සහ මිනිස්බල සැලසුම්කරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(6) ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

(01) (i) ශ්‍රම අධ්‍යයන ක්‍රියාවලිය තුළ ජනගහන අධ්‍යයනයෙහි වැදගත්කම උදාහරණ දක්වමින් පහදන්න.

(ලකුණු 10)

(ii) ශ්‍රම වෙළඳපොල විශ්ලේෂණය, මානව සම්පත ප්‍රශස්ත අයුරින් උපයෝගී කර ගැනීමට දායක වන අයුරු විමසන්න.

(ලකුණු 10)

(02) (i) ජනගහන අධ්‍යයනය ආශ්‍රිතව ඉදිරිපත් වී ඇති න්‍යායාත්මක පසුබිම හා සංකල්ප දක්වන්න.

(ලකුණු 10)

(ii) "ප්‍රජා විද්‍යා සංක්‍රාන්තිය රටක කාලානුරූපී ජනගහන තොරතුරු මැනවින් නිරූපනය කරවයි." ඉහත ප්‍රකාශය විමසන්න.

(ලකුණු 10)

(03) (i) ජනගහන හා මිනිස්බලය ආශ්‍රිත දත්ත මූලාශ්‍ර නම් කරන්න.

(ලකුණු 08)

(ii) ශ්‍රම අධ්‍යයනයේදී එම දත්ත මූලාශ්‍රවල වැදගත්කම විමසන්න.

(ලකුණු 12)

(04) (i) "සංක්‍රමණ ක්‍රියාවලිය වඩා සංකීර්ණ වූ ජීව සංසිද්ධියකි". ඉහත ප්‍රකාශය විමසන්න.

(ලකුණු 05)

(ii) පහත දැක්වෙන වගුව මගින් එක්තරා රටක i, ii, iii, iv වන කලාප 4ක් සඳහා ජනගහන තොරතුරු නිරූපනය වේ. එම දත්ත භාවිතයෙන් පහත දැකවෙන මිනුම් ii හා iv කලාපයන් සඳහා පමණක් ගණනය කරන්න.

a. ඇතුළු සංක්‍රමණ අනුපාතිකය.

b. පිට සංක්‍රමණ අනුපාතිකය.

c. ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය.

d. දළ සංක්‍රමණ අනුපාතිකය.

e. ජීව කාලීන අසංක්‍රමණිකයන් සංඛ්‍යාව.

| දැනට පදිංචි ප්‍රදේශය | උපන් ප්‍රදේශය | | | |
|---|---|---|---|---|
| | i | ii | iii | iv |
| i | 465 | 568 | 328 | 490 |
| ii | 372 | 442 | 435 | 560 |
| iii | 128 | 565 | 560 | 375 |
| iv | 235 | 327 | 690 | 650 |

(ජනගහනය දහස් වලිනි.)

(ලකුණු 10)

(iii) පහත දැක්වෙන දත්ත මගින් එක්තරා ප්‍රදේශ දෙකක අන්තර් සංගණන කාල පරාසය තුළ ජනගහනයේ වෙනස්වීම නිරූපනය වේ. එම දත්ත භාවිතයෙන් අභ්‍යන්තර ශුද්ධ සංක්‍රමණය ගණනය කරන්න.

| | ප්‍රදේශය | |
|---|---|---|
| | A | B |
| අවසාන සංගණනයෙන් වාර්තා වූ ජන සංඛ්‍යාව (2011) | 475 860 | 896 760 |
| අවසාන සංගණනයට පෙර සංගණනයෙන් වාර්තා වූ ජන සංඛ්‍යාව (2001) | 695 420 | 576 239 |
| සංගණන දෙක අතර තුළ වාර්තා වූ උපත් සංඛ්‍යාව | 218 650 | 387 474 |
| සංගණන දෙක අතර තුළ වාර්තා වූ මරණ සංඛ්‍යාව | 96 750 | 196 972 |

ඉහත සංක්‍රමණ දත්ත වලට අනුව A හා B ප්‍රදේශවල ජනගහන ලක්ෂණ විමසන්න.

(ලකුණු 05)

05) i පහත සඳහන් වගුව මගින් A නම් වූ රටෙහි 2014 වර්ෂය සඳහා ජනගහනයෙහි සාඵල්‍යතා තොරතුරු නිරූපනය වේ. එම දත්ත භාවිතයෙන්,

a. දළ උපත් අනුපාතිකය.

b. වයස් විශේෂිත සාඵල්‍යතා අනුපාතික.

c. මුළු සඵලතා අනුපාතිකය ගණනය කරන්න.

d. වයස් විශේෂිත සාඵල්‍යතා වක්‍රය නිර්මාණය කරන්න.

(ලකුණු 10)

| ස්ත්‍රී ජනගහන වයස | ස්ත්‍රී ජන සංඛ්‍යාව (දහස්) | සජීවී දරු උපත් සංඛ්‍යාව |
|---|---|---|
| 15-19 | 2100 | 68975 |
| 20-24 | 1675 | 177965 |
| 25-29 | 1650 | 243860 |
| 30-34 | 1559 | 186096 |
| 35-39 | 1668 | 96878 |
| 40-44 | 1634 | 30860 |
| 45-49 | 1286 | 2868 |

මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව (දහස්) = 47896

(ii) ජනගහන අධ්‍යයනයේදී හඳුනාගත හැකි සාඵල්‍යතා විභේදන නම් කරන්න.

(ලකුණු 05)

(iii) රටක සාඵල්‍යතා මට්ටම එහි ශ්‍රම සැපයුම කෙරෙහි ඇතිකරන බලපෑම පහදන්න.

(ලකුණු 05)

06. (i) "මර්ත්‍යතා අධ්‍යයනය රටක ජනගහනය පිළිබඳ කැඩපතක් මෙන් ම මිනිස්බල සැලසුම්කරණය වෙනුවෙන්ද උපකාරී වේ." ඉහත ප්‍රකාශය උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 10)

(ii) එක්තරා ප්‍රදේශයක 2011 වර්ෂය සඳහා වාර්තා වූ ජනගහන තොරතුරු පහත වගුවෙන් නිරූපනය වේ

| වයස් කාණ්ඩය (අවුරුදු ) | මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව | | වාර්ෂික මරණ සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |
| 1ට අඩු | 14882 | 16780 | 2185 | 368 |
| 1 - 9 | 132106 | 139760 | 86 | 98 |
| 10 - 19 | 165154 | 186280 | 92 | 150 |
| 20 - 29 | 210180 | 268294 | 153 | 379 |
| 30 - 39 | 166741 | 187580 | 180 | 830 |
| 40 - 49 | 137480 | 156780 | 350 | 1250 |
| 50 - 59 | 103020 | 128790 | 675 | 1750 |
| 60+ | 128966 | 109260 | 4960 | 5765 |

Iii ඉහත දත්ත ඇසුරින්,

i. දළ මරණ අනුපාතිකය.

ii. ළදරු මරණ අනුපාතිකය.

iii. වයස් - පුම්තිරි විශේෂිත මර්ත්‍යතා අනුපාත ගණනය කරන්න.

iv. එම රටෙහි මර්ත්‍යතා රටාවන් පිළිබඳ කෙටියෙන් විමසන්න.

(ලකුණු 10)

07 i. පහත දැක්වෙන වගුව මගින් X නම් වූ රටෙහි ජනගහන තොරතුරු පිළිබිඹු වේ. එම දත්ත භාවිතයෙන්,

a. ජනගහනයේ වයස් ප්‍රමිතිරි ව්‍යුහය නිරූපිත පිරමිඩය නිර්මාණය කරන්න.

(ලකුණු 05)

b. ළමා යැපුම් අනුපාතය, වැඩිහිටි යැපුම් අනුපාතය හා මුළු යැපුම් අනුපාතය ගණනය කරන්න.

(ලකුණු 05)

| වයස් කාණ්ඩය | ජනගහන (දහස්) | | |
|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| 0 – 4 | 895 | 950 | 1845 |
| 5 – 9 | 878 | 921 | 1799 |
| 10 – 14 | 905 | 895 | 1800 |
| 15 – 19 | 935 | 899 | 1834 |
| 20 – 29 | 857 | 856 | 1713 |
| 30 – 39 | 705 | 783 | 1488 |
| 40 – 49 | 681 | 789 | 1470 |
| 50 – 59 | 768 | 957 | 1725 |
| 60 – 69 | 684 | 808 | 1492 |
| 70+ | 1235 | 968 | 2203 |

ii. ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ප්‍රමිතිරි ව්‍යුහය ආශ්‍රිත අතීත, වර්තමාන හා අනාගත තත්වය විමසන්න

(ලකුණු 10)

8. පහත සඳහන් මාතෘකා 04ක් පිළිබඳ කෙටි සටහන් ඉදිරිපත් කරන්න.

i. ශ්‍රී ලංකාවේ මිනිස් බල සැලසුම්.

ii. ඌණ සේවා නියුක්තිය.

iii. නියැදි සමීක්ෂණ.

iv. ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණ.

v. මර්ත්‍යතා විච්ඡේදන.

vi. වයස් ප්‍රමිතිරි ව්‍යුහය

(ලකුණු 05X04=20)